*සැ. යු.*– 2007.04.27 දින පළවූ අංක 1495 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,496- 2007 මැයි 04 වැනි සිකුරාදා - 2007.05.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 421 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 420 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 421 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 367 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 422 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් .. ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


(i) *සැ. යු.*– ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) හෙවිජ් භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 163

අංකය - ඩී/ඒඑෆ්/8/1.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගුවන් කොමදෝරු නිලයට උසස් කෙරේ :

තාවකාලික ගුවන් කොමදෝරු ඉලංගරත්න ප්‍රේමනාත් බුද්ධිවිමල ලියනගේ (01285) - කාර්/ඉංජි 2006.08.24

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006, ඔක්තෝබර් මස 18 දින
කොළඹ දී ය.

05-34

---

2007 අංක 165

අංක ඩී/ඒඑෆ්/9/1.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ :

විංග් කමාන්ඩර් අජිත් ගොඩ්වින් නැතැනියල්ස් (01419) පාලන/රෙජි - 2005.10.26
විංග් කමාන්ඩර් ලලිත් ශ්‍රීලාල් අබේසේකර (01441) පාලන/රෙජි - 2006.01.01

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

05-31

---

2007 අංක 164

අංකය - ඩී/ඒඑෆ්/8/1.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ :

ගෲප් කැප්ටන් ඉලංගරත්න ප්‍රේමනාත් බුද්ධිවිමල ලියනගේ (01285) කාර්/ඉංජි - 2006.01.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 දින
කොළඹ දී ය.

05-35

---

2007 අංක 166

D/AF/521/1.

## ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම සහ ශාඛාවට ඇතුළත් කිරීම

පහත නම සඳහන් නිලධාරිනිය ඇගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ බලපත්‍රිත ලුතිනන්වරියක වශයෙන් පත් කිරීම සහ එදින සිට නමට ඉදිරියෙන් දක්වා ඇති ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කිරීමට ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත :

| *නම සේවා අංකය* | *නිලය* | *ශාඛාව* | *දිනය* |
|---|---|---|---|
| පැලවත්ත විතානලාගේ රුචිනි රසිකා පෙරේරා ස්/0501 | ප්ලයිට් ලෙප්ටිනන්ට් | වෛද්‍ය | 2006.01.12 |

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

05-33

අංකය : ඩී/ඒඑෆ්/539.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ - ස්ථිර බලසේනාව

#### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් සංශෝධනය කිරීම

පහත නම සඳහන් කැඩෙට් නිලධාරියාගේ අධිකාරියට පත් කිරීම හා ශාඛාවට ඇතුළත් කිරීම පිළිබඳව 1998 දෙසැම්බර් මස 11 වන දින අංක 1058-1998 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති 1998 අංක 664 දරණ නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

1997 මාර්තු මස 05 වන දින සිට පහත නම සඳහන් කැඩෙට් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ෆ්ලයින් ඔෆිසර් නිළයට පත් කිරීම සහ එදිනම සිට ඔහුගේ නමට ඉදිරියෙන් ඇති ශාඛාවට ඇතුලත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කැඩෙට් නිලධාරි උපුල් සංජ ලොරෙන්සු තොටහේවගේ (01972) - කාර්/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006, මැයි මස 23 දින
කොළඹ දී ය.

05-32

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 167

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

කේ. ටී. එම්. එන්. ද සිල්වා මෙනෙවිය 2006 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්

05-67

---

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනයයි

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 5(5) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත නම සඳහන් නිලධාරියා සාමාජික ධූරයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරමි.

එස්. කේ. එස්. එච්. කේ. සූරියආරච්චි,
අංක 423/8,
සමගි මාවත,
උඩහමුල්ල,
නුගේගොඩ.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2007 අප්‍රේල් මස 17 වැනි දින,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය,
අංක 34, නාරාහේන්පිට පාර,
නාවල.

05-41/2

### නිවේදනයයි

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 5(5) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත නම සඳහන් නිලධාරියා සාමාජික ධූරයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරමි.

එල්. අබේගුණසේකර,
"අබේසිරි",
ගෝනවල,
කැළණිය.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2007 අප්‍රේල් මස 17 වැනි දින,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය,
අංක 34, නාරාහේන්පිට පාර,
නාවල.

05-41/1

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ගිණුම් අංකය : 1900207301.
ණය ගිණුම් අංකය : 138191.

2007 ජනවාරි මස 26 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2001 දෙසැම්බර් මස 28 වැනි දින අංක 3291 හා 2003 පෙබරවාරි මස 08 වැනි දින අංක 3739 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කර යටතේ අහමඩ් මීරා සයිබු මොහමඩ් රිස්වි යන අය ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හාරලක්ෂ විසිපන්දහස් නවසිය අනූනවයයි ශත දහතුනක (රු. 4,25,999.13) මුදලක් 2005 ජුනි මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හාරලක්ෂ විසිපන්දහස් නවසිය අනූනවයයි ශත දහතුනක (රු. 4,25,999.13) මුදල හා 2005 ජුලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 280,588.29ක මුදලක් සඳහා වාර්ෂිකව 25% බැගින් වූ පොළිය ද, හා රු. 124,000 ක මුදලක් සඳහා වාර්ෂිකව 17% බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 3291 සහ 3739 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර, පල්ලේසියපත්තුවේ, අලුත්ගම උදුගොඩ පිහිටි කොස්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ලියනගේ සිරිපාල විසින් මැන සාදන ලද 2001 සැප්තැම්බර් මස 21 වැනි දින හා අංක 1130 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 02 ට මායිම් එනම්, උතුරට : ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 01න් ද, නැගෙනහිරට : වේල්ලෙන් ද, දකුණට : කේ. එම්. අයිදුරුස් විසින් හිමිකම් කියන ඉඩමෙන් ද (මින් පෙර සෙගු මොහමඩු විසින් හිමිකම් කියන ලැබූ) හා බස්නාහිරට : මාතලේ සිට ගලේවෙල දක්වා දිවෙන මහා මාර්ගයෙන් ද යන මෙකී මායිම් තුළ පර්චස් එකොළහයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 11.1) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉහත සඳහන් ලොට් 2 පහත සඳහන් ඉඩමේ නැවත මැණුමක්, ඉහත කී අලුත්ගම ගමේ පිහිටි කොස්ගහමුල වත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම් එනම් උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : වේල්ලෙන් ද, දකුණට : සේගු මොහමඩු ගේ ඉඩමෙන් ද හා බස්නාහිරට : මාතලේ සිට ගලේවෙල දක්වා දිවෙන පාරෙන්ද යන මෙකී මායිම් තුළ රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු සියලු දේ. මෙය මාතලේ ඉඩම් කාර්යාලයේ ඩී 383/130 වෙළුම පත්‍රිකාව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-77/4

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 182099.

2006 නොවැම්බර් මස 24 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2003 දෙසැම්බර් මස 31 වැනි දින අංක 8517 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කර යටතේ හේනේගෙදර කරුණාතිලක ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අසූහතරදාස් අටසිය තිස්හතයි ශත හතලිස් හතක (රු. 2,84,837.47) මුදලක් 2006 ඔක්තෝබර් මස 23 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ අසූහතරදාස් අටසිය තිස්හතයි ශත හතලිස් හතක (රු. 2,84,837.47) මුදල හා 2006 ඔක්තෝබර් මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 244,366.15ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 8517 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, පටපුළුව, බෝමළුව පාරේ අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව මැදසිය පත්තුවේ, හැදෙනිය ගමේ පිහිටි දුනුමන්ඩලගොල්ලවත්ත *නොහොත්* දුනුමන්ඩලගොඩවත්ත (කුරුණෑගල පාර වරිපනම් අංක 122-130 දක්වා දේපළ) නැමැති ඉඩමට බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 1994 මාර්තු මස 9 වැනි දින අංක 4133 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1ට මායිම් එනම්, උතුරට : කාණුවෙන් ද හා ඉහත කී

පිඹුරේ සඳහන් ලොට් 2 වන වරිපනම් අංක 122 දරන දේපළෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 04න් ද, දකුණට : ඉනි වැටෙන් හා කේ. ජේ. ලව්අනාල ජයතිස්ස විසින් හිමිකම් කියන ලද ඉඩමෙන් ද හා බස්නාහිරට : ඉනිවැටෙන් හා කුරුණෑගල-මහනුවර මහා මාර්ගය දෙසට දිවෙන වී. සී. පාරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම අටයි දෙකයි හතක් (අ. 0, රූ. 0, පර්. 10827) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු සියලු දේත් සමග මාර්ගය අන් අය සමඟ පොදුවේ පාවිච්චි කිරීමේ ඇති නෛතික අයිතීන් ද සමඟ වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 598/232හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දුනුමණ්ඩලගොල්ල වත්ත *නොහොත්* දුනුමණ්ඩලගොඩවත්ත (කුරුණෑගල පාර වරිපනම් අංක 122-130 දේපළ) නමැති ඉඩමට ඉහත කී පිඹුරු අංක 4133හි සඳහන් බෙදා වෙන් කරන ලද ලොට් 3ට මායිම් එනම් උතුරට : කුරුණෑගල මහනුවර මහා මාර්ගයට යාබද කාණුවෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ සඳහන් වරිපනම් අංක 126න් ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 04න් ද, බස්නාහිරට : ලොට් 2හි පිහිටි වරිපනම් අංක 122න් ද යන මෙකී මායිම් තුළ පර්චස් දෙකයි දශම දෙකයි බිංදුවයි අටක් විශාල ඉඩම හා එහි තුළ පිහිටි වරිපනම් අංක 124 දරන දේපළ හා මාර්ගය අන් අය සමඟ පොදුවේ පාවිච්චි කිරීමේ ඇති නෛතික අයිතිය ද සමගින් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 598/233හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-77/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 200752.

2007 ජනවාරි මස 26 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2003 ජූනි මස 11 වැනි දින අංක 3881, 2003 ඔක්තෝබර් මස 18 වැනි දින අංක 4092 හා 2004 ජනවාරි මස 20 වැනි දින අංක 4258 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කර යටතේ ස්මයිල්ගේ මොහමඩ් රිල්වාන් යන අය ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හාරලක්ෂ තිස්තුන්දාස් පන්සිය නවයයි ශත අනූ දෙකක (රු. 4,33,509.92) මුදලක් 2007 ජනවාරි මස 01 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හාරලක්ෂ තිස්තුන්දාස් පන්සිය නවයයි ශත අනූ දෙකක (රු. 4,33,509.92) මුදල හා 2007 ජනවාරි මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 3,57,500ක මුදලක් සඳහා වාර්ෂිකව 30% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 3881, 4092 හා 4258 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු පල්ලේසියපත්තුවේ, අලුත්ගම උඩුගොඩ පිහිටි කොබෙයිගලේහේන *නොහොත්* වත්ත *නොහොත්* කොබ්බෙවෙලේහේන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6ට බලයලත් මානක ජේ. එම්. ජයසේකර විසින් මැන සාදන ලද 1989 ජූලි මස 09 වැනි දින හා අංක 1242 දරන පිඹුර ප්‍රකාරව මායිම් එනම්, උතුරට : පිඹුරු අංක 1242 හි ලොට් අංක 5න් ද, නැගෙනහිරට : මාතලේ සිට ගලේවෙල දක්වා දිවෙන මාර්ගයෙන් ද, දකුණට : එස්. එම්. ජුනයිඩීන් විසින් හිමිකම් කියන ඉඩමෙන් ද හා බස්නාහිරට : මොහිඩීන් අබ්දුල් කාදර් විසින් හිමිකම් කියන ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, වගාව, ඇතුළු දේපළට ස්ථිර ලෙස සවිකර ඇති සවිකිරීම්, යන්ත්‍රසූත්‍ර හා අනිකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් තිහයි (අ. 0, රූ. 0, පර්. 30) මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීම් කාර්යාලයේ ඩී 455/165හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-77/3

---

## රුහුණ සංවර්ධන බැංකුව-මොරවක ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති *විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2007.01.23 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහාන් එල්. ජී. ගමාච්චි මහතා විසින් සහතික කරන ලද 2006.05.10 දිනැති අංක 5867 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අපලාදෙනිය, ඊඳඩුකිත, තල්ගස්වත්ත පදිංචි රුබසිංසිරිවර්ධන ඩනී සහ අරුම්පෙරුම කංකානම්ගේ පියල් චන්දන මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ අසූතුන්දහස් නමසිය හැටක් (රු. 4,83,960) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2006.11.09 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් හාරලක්ෂ අසූතුන්දහස් නමසිය හැටක (රු. 4,83,960) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 5867

උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලපලාදෙනිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඊදඩුකිත ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අගපි 25හි නිරූපිත මහඅරඹහේන නම්වූ උතුරට : ටී. ඒ. කේ. ජේමිස්අප්පුගේ ඉඩම ද, නැගෙනහිරට : කේ. එස්. රූපසිංහගේ ඉඩම ද, දකුණට : ආර්. ජේ. සයිමන්ගේ ඉඩම ද, බස්නාහිරට : එස්. එස්. රූපසිංහගේ ඉඩම ද, මායිම්වූ අක්කර දෙකයි, රූඩ් එකක් (අ. 2, රූ. 01, පර්. 0) විශාල ඉඩමේ මුළු බිම ඒ තුළ පිහිටි සියළු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමඟ වේ. (මාර/5/ප්‍ර/32488 සහ 1996.03.05) ඉහත කී ඉඩම අගපි 25හි අතිරේඛ අංක 08හි පත්‍ර අංක 13හි පහත පරිදි නිරූපණය වේ.

ඉහත කී ඊදඩුකිත ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අගපි 25හි අංක 617 දරන කැබැල්ල නම් වූ, උතුරට : අගපි 25හි අංක 618 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අගපි 25හි අංක 614 දරන පාර ද, දකුණට : මහඅරඹේ දොළ රක්ෂිතය සහ අගපි 25හි අංක 618 දරන කැබැල්ල ද, බස්නාහිරට : අගපි 25 හි අංක 620 දරන කැබැල්ල ද, මායිම් වූ අක්කර දෙකයි, රූඩ් එකක් (අ. 2, රූ 1, පර්. 0) විශාල ඉඩමේ මුළු බිම එතුළ පිහිටි සියලු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමඟ වේ.

මෙම දේපළ LDO 8/27 යටතේ 2006.05.10 දින මොරවක ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

2007 ක් වූ ජනවාරි මස 23 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන,
මාතර.

05-68/1

---

## රුහුණ සංවර්ධන බැංකුව - වැලිගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2005.10.26 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තිලක් කරුණානායක මහතා විසින් සහතික කරන ලද 2004.04.06 දිනැති අංක 616 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මිරිස්ස-උතුර "යමුනා" හි පදිංචි මහගමගේ ලක්මාල් විශාන්ත සහ රෙෂානි ශාලිකා අතුකෝරාළ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අනූහත්දහස් තුන්සියයක (රු. 97,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2005.01.01 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් අනූහත්දහස් තුන්සියයක (රු. 97,300) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 616 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම නගර සභා සීමාව තුළ වැලිගම, හෙට්ටිවීදියේ පිහිටි බණ්ඩාරනායක මාවතේ යැයි කියා ඇතත්, වඩා නිවැරදි ලෙස අග්‍රබෝධි මාවතේ පැරණි වරිපනම් අංක 1872 දරන නව වරිපනම් අංක 1/24 දරන වෙහෙරපල්ලේගල ගාව කුඹුර සහ වෙහෙරපල්ලේ මැද කුඹුරේ බෙදා වෙන් කළ අංක 01 සහ 02 දරන ඒකාබද්ධ ඉඩමේ බෙදා වෙන්කළ ඊ අක්ෂරය දරන කැබැල්ලෙන් නැවත බෙදා වෙන්කළ ඊ-1 අක්ෂරය දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 4350 පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ බී අක්ෂරය දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ බෙදා වෙන් කළ අංක 03 සහ අංක 04 දරන කැබලි ද, දකුණට : අංක 309 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ මෙම ඉඩමේ ඊ-02 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 4350 පිඹුරේ නිරූපිත සී අක්ෂරය දරන (අඩි 15ක් පළල පාර) කැබැල්ල ද යන මෙහි තුළ පර්චස් දහනවයක් (අ. 0. රූ. 0, පර්. 19) විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමඟ බිම වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D960/201හි 2004.04.12 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

2005ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන,
මාතර.

05-68/2

---

## රුහුණ සංවර්ධන බැංකුව - කරන්දෙනිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2006.08.08 දින පවත්වන ලද රුහුණ සංවර්ධන

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. වැයිහේන මහත්මිය විසින් සහ එස්. එම්. පී. සිල්වා මහතා විසින් සහතික කරන ලද 2000.08.22 සහ 2003.06.06 දිනැති අංක 32 සහ අංක 2064 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අම්බලන්ගොඩ, මාදම්පේ, සුදුවැලිකඩ පාර, "ධම්මික" ලිපිනයේ පදිංචි තිරිමාදුර දමිත් ධම්මික මෙන්ඩිස් විජේරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්පන්දහස් හයසිය නමයක (රු. 2,55,609) මුදලක් සහ රුපියල් හතලිස් අටදහස් දෙසීයක (රු. 48,200) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2004.11.19 දින සිට සහ 2004.08.31 දින සිට වර්ෂයකට 20.5% සහ 24% බැගින් රුපියල් දෙලක්ෂ පනස්පන්දහස් හයසිය නමයක (රු. 2,55,609) ක මුදල සහ රුපියල් හතලිස් අට දහස් දෙසීයක (රු. 48,200)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 32 සහ අංක 2064 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, මාදම්පේ, ඉඩන්තොට, සුදුවැලිකඩ පිහිටි බලයලත් මානක එස්. ප්‍රීති වීරවර්ධන මහතා විසින් 1988ක් වූ මැයි මස 31 වැනි දින මැන සාදන ලද අංක 636 දරන පිඹුර ප්‍රකාර පැලවත්තේ බෙදා වෙන් කළ අංක 03 දරන කැබැල්ල නම් වූ උතුරට : හුණුපිටිය ද, නැගෙනහිරට : බෝගහවත්ත ද, දකුණට : අංක 04 සහ තොටගමුවේ ඇත්තන්ගේවත්ත ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 02 දරන කැබැල්ල ද, මායිම් වූ රූඩ් එකයි, පර්චස් එකයි, දශම හය (අ. 0, රූ. 1, පර්. 1.6)ක් විශාල ඉඩමේ මුළු බිම සහ ඊට අයත් සියලු ගහකොළ, පළතුරු ආදිය ද වේ. (දෙවන ණය මුදල සඳහා ද මෙම දේපළෙහිම ද්විතීයන උකස තබා ඇත).

මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 711/236 යටතේ 2003.06.09 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

රුහුණු සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන.

05-68/3

---

## රුහුණු සංවර්ධන බැංකුව-කැකණදුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2004.06.09 දින පවත්වන ලද රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රකුමාර විජේගුණවර්ධන මහතා විසින් සහතික කරන ලද 1998.10.23 දින හා අංක 16432 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙවිනුවර, කපුගම (බටහිර) "දයාවාස" හි පදිංචි සිංගප්පුලිආරච්චිගේ ජගත් චන්ද්‍රකුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අසූඅටදහස් පන්සියයක (රු. 1,88,500) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2001.08.31 දින සිට වර්ෂයකට 23% බැගින් රුපියල් එක්ලක්ෂ අසූඅටදහස් පන්සියයක (රු. 1,88,500) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 16432 උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, කපුගම පිහිටි ගොඩකරුඳුගහවත්ත නමැති ඉඩමේ කොටස් වන මාතර දිස්ත්‍රික් උසාවියේ අංක 11960 දරන නඩුවේ පරිදි බෙදා වෙන් කළ "කේ" සහ "එම්" අක්ෂර දරන කැබලිවලින් සමන්විත ඒකාබද්ධ ඉඩම නැවත මැන බෙදා වෙන්කළ අංක 02 දරන කැබැල්ලට ඒ. ඩී. පලිහක්කාර මිනින්දෝරු මහතාගේ අංක 9305 සහ 1995.10.20 දින දරන සැලැස්මේ ප්‍රකාර මායිම්, උතුර සහ නැගෙනහිරට : කුඹල්ගම සිට දෙවිනුවර දක්වා දිවෙන මාර්ගය ද, දකුණට : මුලනෙ පිට්ටෙන්නද, බස්නාහිරට : අංක 9305 දරන සැලැස්මේ සඳහන් අංක 01 දරන කැබැල්ල ද යන මෙහි තුළ පර්චස් දහසයයි දශම එකයි හතර (අ. 0, රූ. 0, පර්. 16.14) විශාල ඉඩම සියළු ගහකොළ, පළතුරු සමග බිම සහ එහි පිහිටි සියළුම ගොඩනැගිලි ද වේ.

එකී ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 537/27 දරන පොතේ 1998.10.26 දින ලේඛනගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

රුහුණු සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන.

05-68/4

---

## මහජන බැංකුව

### දේපළ වෙන්දේසි යෝජනා සංශෝධනය

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1999.10.28 දින සම්මත කර, 2002.11.12 දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල ද, 2002.11.22 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, පළකරන ලද හෙට්ටි ආරච්චිගේ දොන් ක්‍රිස්ටි නිමල් අප්පුහාමි යන අය විසින් උකසට තබන ලද දේපළ සම්බන්ධයෙන් වූ

වෙන්දේසි යෝජනාවෙහි දේපළ විස්තරය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු ය.

දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ දූනගහපත්තුවේ කලුරිප්පුව නැගෙනහිර පිහිටියාවූ ද, සර්වේ ජනරාල් විසින් සකස් කරන ලද අංක ජී. ඒ. එම්. 2654 හා 1996 මාර්තු 10 වැනි දින දරන සැලැස්මේ ලොට් අංක 01 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : ඉ. ප්‍ර. කො. ට පැවරී ඇති මිල්ලගහ වත්ත ද, බස්නාහිරට : මැගනට් සපරමාදු, එම්. ජෝකිනු අප්පුහාමි සහ ජේ. ඩී. එස්. සපරමාදු විසින් හිමිකම් කියන මිල්ලගහ වත්ත ද මායිම් වන්නාවූ ද, හෙක්ටයාර් බිංදුවයි, දශම හතරයි පහයි එකක් (හෙ. 0.451) විශාල වූ ද, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 767/71 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, මිල්ලගහවත්ත යැයි කියනු ලබන බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සඳහා වූ බදු අයිතිය වේ.

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය - 01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාප - 01)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

05-70

සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, ගන්දොළහ පත්තුවේ, යටත්තාවල ගමේ පිහිටි "සනිමේඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින් මැන සාදන ලද අංක 139/96 සහ 1996.09.30 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 232 දරන ඉඩමට මායිම්, උතුරට : කැබලි අංක 233 ද, නැගෙනහිරට : කැබලි අංක 224 දරන පාර ද, දකුණට : කැබලි අංක 231 ද, බස්නාහිරට : මහ ඔය ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු වූ ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමඟ එකී පිඹුරේ සඳහන් කැබලි අංක 224 දරන පාර පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීම් අයිතිය ද සමග වේ. (ඊ 1095/54-කෑගල්ල).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී,
(කුරුණෑගල/මාතලේ).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

05-73

---

## මහජන බැංකුව - පොල්ගහවෙල ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතේ සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.17 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. දයානි පෙරේරා මිය. විසින් සහතික කරන ලද 2003.10.06 දිනැති අංක 702 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම අරඹේගෙදර කිංස්ලි සමරනායක සහ පතිරගේ දෝන නයනා මල්කාන්ති යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ අනූ අටදාස් හැත්තෑ එකයි ශත විසි හතක (රු. 3,98,071.27) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.11.07 දින සිට වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් රුපියල් තුන්ලක්ෂ අනූ අටදහස් හැත්තෑ එකයි ශත විසි හතක (රු. 3,98,071.27) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ අනූ අටදහස් හැත්තෑ එකයි ශත විසි හතක (රු. 3,98,071.27) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මහතා විසින් එකී අංක 702 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින්

---

## මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. විජේරත්න මයා සහ අනුපමා මුහන්දිරම් මිය විසින් සහතික කරන ලද පිළිවෙලින් 1998.12.16 දිනැති අංක 313 සහ 2001.02.20 දිනැති අංක 1292 දරන උකස්කරයන් ප්‍රකාර දිවාකර මොහොට්ටාලාගේ සුනිල් සමරදිවාකර සහ දිවාකර මොහොට්ටාලාගේ සිරිසේන යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද එකී උකස්කරයන් යටතේ දැනට පිළිවෙලින් රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හත්සිය අසූ හතයි ශත එකොළහක (රු. 1,14,787.11) මුදලක් සහ රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, පිළිවෙලින් 2002.12.29 දින සිට වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් සහ 2004.01.01 දින සිට වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පිළිවෙලින් රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හත්සිය අසූ හතයි ශත එකොළහක (රු. 1,14,787.11) මුදලක් සහ රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකරනු

ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හත්සිය අසූහතයි ශත එකොළහක (රු. 1,14,787.11) මුදලක් සහ රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මහතා විසින් එකී අංක 313 සහ අංක 1292 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, හුණුකුඹුර නමැති ගමෙහි පිහිටි "හිටිනාවත්ත *නොහොත්* අරඹේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. බී. හේරත් මහතාගේ අංක 23/98 සහ 1998.09.08 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන ඉඩමට මායිම්, උතුරු-නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඩැනියෙල්ස් මහතාගේ 1925.12.29 දින දරන පිඹුරේ කැබලි අංක 09 ඒ 1 (දැනට ඩී. එම්. හේරත් බණ්ඩාගේ සහ ඩී එම්. බණ්ඩාර මැණිකාගේ දරුවන් හිමිකම් කියන වත්ත ද), දකුණු-නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණු-බස්නාහිරට : බණ්ඩාගේ කුඹුර ද, (දැනට ආර්. එම්. අප්පුහාමි හිමිකම් කියන කුඹුර) ද, උතුරු-බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඩැනියෙල්ස් මහතාගේ 1925.12.29 දින දරන පිඹුරේ කැබලි අංක 09 (දැනට ආර්. එම්. අබේරත්න හුණුකුඹුර සහ ඩී. එම්. දිසානායක හිමිකම් කියන ළිඳ කුඹුර සහ (දැනට ආර්. එම්. අප්පුහාමි හිමිකම් කියන කුඹුර) ද, යන මෙකී මායිම් තුළ වූ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිහතරක් (අ. 01, රූ. 01, පර්. 24) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, සහ ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමඟ වේ.

ඉහත ඉඩම පහත සවිස්තර ඉඩම නැවත මැන සාදන ලද්දකි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, හුණුකුඹුරේ පිහිටි "හිටිනාවත්ත *නොහොත්* අරඹේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඩැනියෙල්ස් මහතා විසින් 1925.12.29 දින මැන සාදන ලද පිඹුරේ සඳහන් කැබලි අංක 08 දරන ඉඩමට මායිම්, උතුරට : ඉහත සඳහන් පිඹුරේ කැබලි අංක 09 සහ 09 ඒ දරන කොටස් ද, නැගෙනහිරට : උක්කුබණ්ඩාගේ වත්ත ද, දකුණට : බණ්ඩාගේ කුඹුර සහ උක්කුබණ්ඩාගේ වත්ත ද, බස්නාහිරට : ඉහත සඳහන් පිඹුරේ කැබලි අංක 09 ද යන මෙකී මායිම් තුළ වූ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිහතරක් (අ. 01, රූ. 01, පර්. 24)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, සහ ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග වේ. (ඩී 1151/122-කුරුණෑගල).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී,
(කුරුණෑගල/මාතලේ).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

05-72

## සීමාසහිත සෙලාන් බැංකුව - මහනුවර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.03.05 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

ගිණුම් අංක : 0170-114792-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝති විසින් සහතික කරන ලද 1991 පෙබරවාරි මස 01 දිනැති අංක 223, 2001 මැයි මස 15 දිනැති අංක 603 හා 2001 නොවැම්බර් මස 7 දිනැති අංක 688 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මහනුවර ටී. කේ. මෝටර් ට්‍රේඩර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමරකෝන් මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්හතරලක්ෂ අසූනව දහස් විසිඑකයි ශත හැත්තෑ අටක (රු. 34,89,021.78) මුදලක්, 2004 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 34,89,021.78 මුදල ද, 2005 ජනවාරි මස 01 වැනි සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 223, 603 සහ 688 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකරු වන තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බඩ කෝරළේ වැඩ විල්ලිහත්පත්තුවේ වැවගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු සෙනරත් විජේරත්න විසින් සාදන ලද 1993 ජනවාරි 31 දිනැති අංක 1825 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අබේනියවත්ත නමැති ඉඩමේ කොටසක් වන කැබැලි අංක 9 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 8 ද, නැගෙනහිරට : අංක 1562 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 2 ද, දකුණට : එකී අංක 1825 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 10 ද සහ බස්නාහිරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 21 ද, යන මායිම් තුළ පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පෙර කී අබේනියවත්ත නමැති ඉඩමේ කොටසක් වන එකී අංක 1825 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබැලි අංක 10 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී ඉඩමේ කැබලි අංක 9 ද, නැගෙනහිරට : අංක 1562 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 ද, දකුණට : අංක 53 ඩී/91 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 සහ බස්නාහිරට : එකී අංක 1825 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 11 සහ 21 ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පර්චස් දහහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) ක් විශාල එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 21 සහ 22 දරන ඉඩම් කැබලි උඩින් පවත්නා මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සමඟ සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

### 2 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගම් දහය කෝරළේ පල්ලේගම අම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. වීරපාන විසින් සාදන ලද 1988 ජූලි 17 දිනැති අංක 234 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රද්දගස්පනාවැවතැන්න නමැති ඉඩමේ කොටසක් වන කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 704 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 11 ද, නැගෙනහිරට : සැලැස්මේ සඳහන් කැබලි අංක 2 සහ පලීල්ට අයිති ඉඩම ද, දකුණට : කැබලි අංක 2 සහ 3 සහ බස්නාහිරට : එකී අංක 704 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 7 ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) ක් විශාල නිවස, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

### 3 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, යටිනුවර මහනුවර මහ නගර සභා සීමාව තුළ මහයියාව කටුගස්තොට පාරේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 1992 අගෝස්තු මස 18 දිනැති මූලික සැලැසුම් අංක 2984 මත බලයලත් මිනින්දෝරු එම්. ටී. ප්‍රැන්ක් ඩයස් විසින් 1998 ඔක්තෝබර් මස 9 දිනැතිව සාදන ලද අතුරු බෙදීමක් වන වැලිකන්ද නමැති ඉඩමෙන් කැබලි අංක 3 බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම ද, නැගෙනහිරට : අංක 742/ඒ දරන සැලැස්මේ කැබලි අංක පී ද, දකුණට : මහනුවර සිට කටුගස්තොට දක්වා යන මහ මාර්ගය ද සහ බස්නාහිරට : එකී අංක 2984 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 ඒ ද යන මායිම් තුළ එකී සැලැස්ම අනුව පර්චස් පහළොවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 15.5) ක් විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
*වැඩ බලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.*

05-97/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - මාවතැල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.02.12 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

ගිණුම් අංක : 0 480-6504720-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. ඩී. අබේරත්න විසින් සහතික කරන ලද 1998 පෙබරවාරි මස 11 දිනැති අංක 601 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. අයි. ගම්ලත් විසින් සහතික කරන ලද 2003 අප්‍රේල් මස 23 දිනැති අංක 671 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කඩුගන්නාව පදිංචි මොහමඩ් සලීම් නුර්ඩීන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑඅට දහස් එකසිය අනූතුනක (රු. 35,78,193.00) මුදලක්, 2004 අප්‍රේල් මස 01 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 35,78,193.00 මුදල ද, 2004 අප්‍රේල් මස 02 වැනි සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 601 සහ 671 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුවට වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපලාත ලගමුව පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඩී. ආදිහෙට්ටි විසින් සාදන ලද 1993.04.17 දිනැති අංක 1631 දරන සැලැස්මේ වෙන්කර පෙන්නුම් කරනු ලබන කැබලි අංක 2 සේ ලකුණු කල කටුගහමුල වත්ත, බැලුන්ගල වත්තට සම්පව පිහිටි ඉඩම් කොටසට මායිම් උතුරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 1, වැට සහ බැලන්ගල වත්ත ද, නැගෙනහිරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 3 ද, දකුණට : කැබලි අංක 4 ලෙස ලකුණු කල මාර්ගය සහ බස්නාහිරට : බැලුන්ගල පාර යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම තුනක් (අ. 0. රූ. 0, පර්. 18.3) විශාල ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව සී 293/160 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපලාත ලගමුව පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඩී. ආදිහෙට්ටි විසින් සාදන ලද 1993.04.17 දිනැති අංක 1631 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 4 ලකුණු ඉඩමට මායිම් උතුරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 2 ද, නැගෙනහිරට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 3 ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : බැලුන්ගල පාර යන මායිම් තුළ පර්චස් එකයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 1.7) විශාල ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව සී 293/161 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති,

05-97/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි ඃ

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ඩ්ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයඩ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | | තැපැල් ගාස්තුව (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| මැයි | 2007.05.04 | සිකුරාදා | 2007.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.11 | සිකුරාදා | 2007.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.18 | සිකුරාදා | 2007.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.25 | සිකුරාදා | 2007.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2007.06.01 | සිකුරාදා | 2007.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.08 | සිකුරාදා | 2007.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.15 | සිකුරාදා | 2007.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.22 | සිකුරාදා | 2007.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.29 | සිකුරාදා | 2007.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2006.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2006.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.